Lesson 46 **Feeling Hungry**

බඩගිනි දැනෙමින්

A: How much time is there until the interval?
හව් මච් ටයිම් ඉස් දෙයා(ර්) අන්ටිල් ද ඉන්ට(ර්)වල් ?
ඉන්ට(ර්)වල් එක වෙනකල් කොච්චර වෙලා තියෙනවද ?

B: There’s still 20 minutes.
දෙයා(ර්)ස් ස්ටිල් ට්වෙන්ටි මිනිට්ස්
තවමත් මිනිත්තු විස්සක් තියෙනවා (still - තවම )

A: I feel hungry
අයි ෆීල් හංග්‍රි
මට බඩගිනි දැනෙනවා /

I already feel hungry
අයි ඕල්රෙඩි ෆීල් හංග්‍රි
මට දැනටමත් බඩගිනි දැනෙනවා

I am beginning to feel hungry
අයැම් බිගිනිං ටු ෆීල් හංග්‍රි
මට දැන් බඩගිනි දැනෙන්න පටන් ගන්නවා(මට දැන් ටික ටික බඩගිනි දැනී ගෙන එනවා)

B: Wait another 20 minutes.
වේට් අනද(ර්) ට්වෙන්ටි මිනිට්ස්
තව මිනිත්තු විස්සක් ඉන්න

A: Don’t you feel hungry?
ඩෝන්ට් යූ ෆීල් හංග්‍රි ?
ඔයාට බඩගිනි දැනෙන්නේ නැද්ද ? [මේකට කියන්නේ නැත ප්‍රරශ්නාර්ථය කියල. ඒ ක්‍රියාව කරනවද කියලා නෙවෙයි, කරන්නේ නැද්ද කියලා අහන්නේ ]

B: I am not that hungry. I had a good breakfast this morning.
අයැම් නොට් දැට් හංග්‍රි . අයි හැඩ් අ ගුඩ් බ්‍රෙක්ෆස්ට් දිස් මෝනිං
මට එච්චරම බඩගිනි නැහැ . මම අද උදේ හොඳ බ්‍රෙක්ෆස්ට් එකක් ගත්තා [මෙහි not that hungry කියන්නේ එච්චරම බඩගිනි නැහැ කියන එක . එය මතක තබා ගන්න ඕන යෙදුමක් ]

A: I couldn’t eat my breakfast properly; I didn’t have time.
අයි කුඩ්න්ට් ඊට් මයි බ්‍රෙක්ෆස්ට් ප්‍රොප(ර්)ලි ; අයි ඩිඩ්න්ට් හැව් ටයිම්
මට හරියට බ්‍රෙක්ෆස්ට් එක ගන්න බැරි වුනා . මට වෙලාව තිබුනේ නැහැ

B: You should have brought it here.
යූ ෂුඩ් හැව් බ්‍රෝට් ඉට් හියර්(ර්)
ඔයාට ඒක(උදේ ආහාරය) මෙහෙ ගේන්න තිබුනා

A: No, I had to rush to the bus halt. I couldn't wait until my mom packed it up.
නෝ, අයි හැඩ් ටු රෂ් ටු ද බස් හෝල්ට් . අයි කුඩ්න්ට් වේට් අන්ටිල් මයි මම් පැක්ඩ් ඉට් අප්
නෑ , මට බස් එකට දුවන්න වුනා. අම්මා ඒක පැක් කරන කල් මට බලන් ඉන්න බැරි වුනා
[ අපේ කට වහරෙන් අපි කියනවා බස් එකට දුවනවා කියලා. නමුත් rush කියන වචනේ තේරුම දුවනවා නෙවෙයි. Rush - කඩි මුඩියේ යනවා ]

B: Then you should have bought something on the way.
දෙන් යූ ෂුඩ් හැව් බෝට් සම්තින් ඔන් ද වේ
එහෙනම් ඔයාට මගදී මොනවා හරි ගන්න(මිලට) තිබුනා
[should have + ක්‍රියා පදයේ " කරලා " කියන රූපය එන්නේ යම් ක්‍රියාවක් කල යුතුව තිබුනා කියන්න . ඒ ව්‍යාකරණ රටාව මේ පාඩම් මාලාවේ දෙවන කොටසේ තියෙනවා ]

A: No way ! I was getting late to school, so I didn't have time to buy anything.
Shall we go to the canteen? I'm very hungry now. We can eat before it becomes crowded.
නෝ වේ , අයි වෝස් ගෙටිං ලේට් ටු ස්කූල් , සෝ අයි ඩිඩ්න්ට් හැව් ටයිම් ටු බයි එනිතිං .
ෂැල් වී ගෝ ටු ද කැන්ටීන්. අයිම් වෙරි හංග්‍රි නව් . වී කැන් ඊට් බිෆෝ ඉට් බිකම්ස් ක්‍රව්ඩඩ්
කිසිම විදියක් නෑ (එහෙම කරන්න විදියක් නෑ ) , මම ඉස්කෝලේ එන්න පරක්කු වෙමින් හිටියේ , ඒ නිසා මට වෙලාව තිබුනේ නැහැ කිසිම දෙයක් ගන්න. අපි කැන්ටින් එකට යමුද ? මට හරි බඩගිනියි දැන්. එතන සෙනග පිරෙන්න කලින් අපිට මොනවා හරි කන්න පුළුවන්
.

B: Okay, let's go. It's a bit early for me to eat, but I'll come with you.
ඕකේ, ලෙට්ස් ගෝ. ඉට්ස් අ බිට් අ(ර්)ලි ෆෝ මී ටු ඊට් , බට් අයි විල් කම් විත් යූ
හරි , අපි යමු . මට නම් කන්න ටිකක් වේලාසන වැඩියි . නමුත් මම ඔයා එක්ක එන්නම්

In the canteen: - කැන්ටින් එකේදී ….

A: What do you want to have?
වට් ඩූ යූ වෝන්ට් ටු හැව් ?
ඔයාට මොනවද ගන්න අවශ්‍යය ?

What would you like to have ?
වට් වුඩ් යූ ලයික් ටු හැව් ?
ඔයා මොනවද ගන්න කැමති ?

What would you buy ?
වට් වුඩ් යූ බයි ?
මොනවද ඔයා ගන්නේ(මිලට) ?

B: Um… just a jam bun for me.
අ … ජස්ට් අ ජෑම් බන් ෆෝ මී
අ … මට ජෑම් බන් එකක් විතරයි

A: Is that enough for you?
ඉස් දැට් ඉනෆ් ෆෝ යූ ?
ඒ ඇද්ද ඔයාට ?

B: Yes, for now. I'll eat something again before the tuition class after school.
යස් . ෆෝ නව් . අයිල් ඊට් සම්තින් අගේන් බිෆෝ ද ටියුෂන් ක්ලාස් ආෆ්ට(ර්) ස්කූල්
ඔව් , දැනට. ඉස්කෝලේ ඇරිලා ටියුෂන් ක්ලාස් එකට කලින් මම ආයෙත් මොනවා හරි කනවා

A: Um… what should I buy ?  I like the fish bun, but I'm not sure about its cleanliness
අ … වට් ෂුඩ් අයි(ෂුඩයි) බයි ? අයි ලයික් ද ෆිෂ් බන් බට් අයෑම් නොට් ෂුව(ර්) අබවුට් ඉට්ස් ක්ලෙන්ලිනස්
අ … මම මොනවද ගන්නේ ? මම කැමතියි මාලු පාන් වලට නමුත් ඒකෙ පිරිසිදු කම ගැන මට විස්වාස නැහැ

I'm not  sure about its hygiene. Last time I ate it, I got a stomach ache. There's also the vegetable  roti
අයෑම් නොට් ෂුව(ර්) අබවුට් ඉට්ස් හයිජීන් . ලාස්ට් ටයිම් අයි ඒට් ඉට්, අයි ගොට් අ ස්ටමක් ඒක් . දෙයාස් ඕල්සෝ ද වෙජිටබල් රොටි
ඒකෙ සෞඛ්‍යාරක්ෂිත භාවය ගැන මට විශ්වාස නැහැ . මම අන්තිමට එකක් කාපුවෙලාවේ මට බඩේ අමාරුවක් හැදුනා , එලවලු රොටිත් තියෙනවා
(cleanliness - ක්ලෙන්ලිනස් - පිරිසිදු කම / hygiene - හයිජීන් - සෞඛ්‍යාරක්ෂිත බව )

B: I tried it yesterday, I didn't like the taste.
අයි ට්‍රයිඩ් ඉට් යෙස්ටඩේ . අයි ඩිඩ්න්ට් ලයික් ද ටේස්ට්
මම ඊයේ කාල බැලුවා , ඒ රහට මම නම් කැමති වුනේ නැහැ

A: Really? Then I won't buy it. I'll take the fish bun, maybe a wade and a cutlet.
රියලි ? දෙන් අයි වෝන්ට් බයි ඉට් , අයිල් ටේක් ද ෆිෂ් බන් , මේ බී අ වඩේ ඇන්ඩ් අ කට්ලට්
ඇත්තටම ? එහෙනම් මම ඒක ගන්නේ නැහැ , මම මාළු පාන් ගන්නවා , සමහරවිට වඩේ එකකුයි කට්ලට් එකකුයි

B: I don't like these cafeteria foods; I always prefer homemade food
අයි ඩෝන්ට් ලයික් දීස් කැෆටේරියා ෆුඩ්ස් . අයි ඕල්වේස් ප්‍රිෆ(ර්) හෝම් මේඩ් ෆුඩ්
මම මේ කැන්ටින් කෑම වලට ආස නැහැ , මම නිතරම කැමති ගෙදර හදන කෑම වලට

A: Me too ! But there's no other option
මී ටූ ! බට් දෙයා(ර්)ස් නෝ අද(ර්) ඔප්ෂන්
මාත් එහෙමයි , නමුත් වෙන විකල්පයක් නැහැ

B: How do these items taste?
හව් ඩූ දීස් අයිටම්ස් ටේස්ට් ?
කොහොමද මේවයේ රහ ?
තරමක් හොදයි

A: Not too bad
නොට් ටූ බැඩ්
එච්චර නරක නැහැ

Quite okay
ක්වයිට් ඕකේ
තරමක් හොදයි

They're alright. But this cutlet isn't very tasty. How's your jam bun?
දේ ආ ඕල්රයිට්. බට් දිස් කට්ලට් ඉස්න්ට් වෙරි ටේස්ටි. හව්ස් යුව(ර්) ජෑම් බන් ?
ඒවා හොදයි . නමුත් මේ කට්ලට් එක නම් එච්චර රහක් නැහැ . ඔයාගේ ජෑම් බනිස් එක කොහොමද ?
[Quite okay/ They are alright කියන දෙකෙන්ම එන්නේ " එච්චර අව්ලක් නැහැ" වගේ අදහසක් ]

B: It's too sweet
ඉට්ස් ටූ ස්වීට්
ඒක පැණි රහ වැඩියි
[ Too වලින් ඒ සමග යෙදෙන අනෙක් පදයේ අර්ථය තව වැඩි වෙනවා]

A: Can I have a bite of it?
කැනයි හැව් අ බයිට් ඔෆ් ඉට් ?
මට ඒකෙන් කෑල්ලක් කන්න පුළුවන් ද ?

B: Oh sure,
ඕ ෂුව(ර්)
අනිවාර්යයෙන් !

A: Um… not bad. Anyway, I like it. Would you like to try this wade?
ම්ම් . නොට් බැඩ් . එනිවේ, අයි ලයික් ඉට් . වුඩ් යූ ලයික් ටු ට්‍රයි දිස් වඩේ ?
ම්ම් … වරදක් නැහැ. කොහොම වුනත් මම ඒකට කැමතියි . ඔයා කැමතිද මේ වඩේ කාල බලන්න ? [Anyway - කොහොම වුනත් ]

B: I like wade. Okay, I’ll try a bit…..m.. It's okay, but it's too salty.
අයි ලයික් වඩේ . ඕකේ , අයිල් ට්‍රයි අ බිට් ….. ම් ..ඉට්ස් ඕකේ , බට් ඉට්ස් ටූ සෝල්ටි
මම වඩේ වලට කැමතියි , හරි , මම පොඩ්ඩක් කාල බලන්නම් …… , ඒක වරදක් නෑ
නමුත් ලුණු වැඩියි

A: Yes, a bit too salt,
යස් , අ බිට් ටූ සෝල්ටි
ඔව් , ටිකක් ලුණු වැඩියි

A: What shall we drink?
වට් ෂැල් වී ඩ්‍රින්ක් ?
අපි මොනවද බොන්නේ ??

B: I will have a cup of tea.
අයි විල් හැව් අ කප් ඔෆ් (කපොෆ් ) ටී
මම තේ එකක් ( තේ කෝප්පයක් )බොනවා

A: A cup of tea is fine. Before that, would you like something else to eat?
අ කප් ඔෆ් (කපොෆ්) ටී ඉස් ෆයින්. බිෆෝ දැට්, වුඩ් යූ ලයික් සම්තින් එල්ස් ටු ඊට් ?
තේ එකක් හොදයි , ඊට කලින් ඔය කැමතිද වෙන මොනවා හරි කන්න ?

[Would you like …….? කියල කරන විමසීම ඉංග්‍රීසි භාෂාවේ බොහොම ආචාරශීලි
විමසීමක්. විශේෂයෙන්ම ඔය කෑම බීම වගේ දෙයක් ගන්න කැමතිද කියලා
විමසද්දී ඔය විදියට අහනවා ]

B: No, I’ve had enough
නෝ , අයිව් හැඩ් ඉනෆ්
නෑ , මට ඇති
[I ‘ve = I have ] [I’ve had enough - මට ඇති/ මට ඇතිවෙන්න ලැබිල තියෙන්නේ
වගේ තේරුමක් එහි තියෙන්නේ ]

No , that ‘s enough for me
නෝ දැට්ස් ඉනෆ් ෆෝ මී
නෑ, මට මේ ඇති

A: What about one more cutlet or a wade?
වට් අබවුට් වන් මෝ කට්ලට් ඕ අ වඩේ ?
තව එක කට්ලට් එකක් හරි වඩයක් හරි කමුද ?

[ What about …. මෙය යම් දෙයක් ගැන යම් විමසීමක් හරි එහෙම නැත්නම් ඒ දෙය
ගැන අනිත් කෙනාගේ අදහස් අහරි අහන්න පාවිච්චි වෙනවා ]

B: No, thanks. I'm full.
නෝ තැන්ක්ස් ,
නෑ, ස්තුතියි, මගේ බඩ පිරිලා

Maybe just one more cutlet.
මේ බී ජස්ට් වන් මෝ කට්ලට්
සමහර විට තව එක කට්ලට් එකක්

Not for me, but you can get one if you want.
නොට් ෆෝ මී ,බට් යූ කැන් ගෙට් වන් ඉෆ් යූ වෝන්ට්
මට නම් එපා ඔයාට ඕනනම් (එකක්) ගන්න

Actually , I'll have another wade. They taste better with tea.
ඇක්චුවලි, අයිල් හැව් අනද(ර්) වඩේ , දේ ටේස්ට් බෙට(ර්) විත් ටී
මම ඇත්තටම තව වඩයක් ගන්නවා, ඒවා තේ එක්ක වඩා රහයි)

හොදයි , ඒකත් ඒක ඉතාම රසවත් සංවාදයක්. ඒ වගේම ඉතාම නිවැරදි විශිෂ්ට ඉංග්‍රීසියෙන් ලියවුනු සංවාදයක්. මේ සියලුම වාක්‍ය හොඳින් අධ්‍යනය කරන්න. කට පාඩම් කරන්න කියල නෙවෙයි කියන්නේ . නමුත් නමුත් නැවත නැවත බලන්න. ඒ විශේෂ සංවාද ඛණ්ඩයන් , වාක්‍යයන් මතක තියා ගන්න උත්සාහ කරන්න. මේ සංවාදයේ අපට හමුවුණු වැදගත් , විශේෂයෙන් මතක තබා ගත යුතු කොටස් පහතින් දක්වනවා ඔබේ විශේෂ අවධානය පිණිස

I am not that hungry.
අයැම් නොට් දැට් හංග්‍රි .
මට එච්චරම බඩගිනි නැහැ

There’s still 20 minutes.
දෙයා(ර්)ස් ස්ටිල් ට්වෙන්ටි මිනිට්ස්
තවමත් මිනිත්තු විස්සක් තියෙනවා

I didn’t have time.
අයි ඩිඩ්න්ට් හැව් ටයිම්
මට වෙලාව තිබුනේ නැහැ

I had to rush to the bus halt.
අයි හැඩ් ටු රෂ් ටු ද බස් හෝල්ට්
නෑ , මට බස් එකට දුවන්න වුනා

No way !
නෝ වේ !
කිසිම විදියකින් නෑ / කිසිම විදියක් නෑ (යමකට කොහොමවත් ඉඩක් නෑ කියලා ඒ කියන්නේ )

It's a bit early for me to eat
ඉට්ස් අ බිට් අ(ර්)ලි ෆෝ මී ටු ඊට්
මට කන්න වේලාසන වැඩියි

Is that enough for you?
ඉස් දැට් ඉනෆ් ෆෝ යූ ?
ඒ ඇද්ද ඔයාට ?

But there’s no other option
බට් දෙයා(ර්)ස් නෝ අද(ර්) ඔප්ෂන්
මාත් එහෙමයි , නමුත් වෙන විකල්පයක් නැහැ

Not too bad
නොට් ටූ බැඩ්
එච්චර නරකක් නැහැ

Quite okay
ක්වයිට් ඕකේ
තරමක් හොදයි

It's too sweet
ඉට්ස් ටූ ස්වීට්
ඒක පැණි රහ වැඩියි

No, I’ve had enough
නෝ , අයිව් හැඩ් ඉනෆ්
නෑ , මට ඇති

They taste better with tea.
දේ ටේස්ට් බෙට(ර්) විත් ටී
ඒවා තේ එක්ක වඩා රහයි)

**Vocabulary 46**

canteen - කැන්ටීන් - ආපන ශාලාව

cafeteria - කැෆටීරියා - ආපන ශාලාව

cleanliness - ක්ලෙන්ලිනස් - පිරිසිදු කම

hygiene - හයිජීන් - සෞඛ්‍යාරක්ෂාව

taste - ටේස්ට් - රස බලනවා , රසය

option - ඔප්ෂන් - විකල්පය , තෝරා ගැනීමේ ඉඩකඩ

salty - සෝල්ටි  - ලුණු සහිත

spicy - ස්පයිසි - සැර (මිරිස් වැඩි )

sugary - ෂුගරි - සීනි  අධික

oily - ඔයිලි - තෙල් අධික

religious observances- රෙලිජස් ඔබ්ස(ර්)වන්සස් - ආගමික වතාවත්

grocery shop - ග්‍රොසරි ෂොප් - සිල්ලර බඩු  කඩේ

grocer - ග්‍රෝස(ර්) - සිල්ලර වෙළෙන්දා

watchman - වොච්මන් - මුරකාරයා

butchery - බුචරි - මස් කඩේ

butcher - බුච(ර්) - මස් වෙළෙන්දා

Hinge – හින්ජ් – සරනේරුව

Tared road (Tarred road) – ටා(ර්)ඩ් රෝඩ් – තාර පාර

Drain – ඩ්‍රේන් – කානුව , අගල

Ditch –ඩිච් – කානුව

Pavement – පේව්මන්ට් – පදික වේදිකාව

Edge –එජ් – අයින , ගැට්ට

Gravel –ග්‍රැවල් – බොරළු

Metal –මෙටල් – ලෝහ

Granite - ග්‍රැනයිට් - කළු ගල් , කළු ගලින් කල